# ඇබෑර්තු

## ගෝලීය අරමුදල මගින් අරමුදල් සපයනු ලබන සෞඛ්‍ය තොරතුරු සහ තත්ත්ව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය

## 01. ව්‍යාපෘති ලේකම් තනතුර

**සුදුසුකම් :**

- අ.පො.ස. (සා/පෙළ) විභාගය, ඉංග්‍රීසි හා සිංහල/ දෙමළ භාෂා ඇතුළත්ව සම්මාන තුනක් (3) සහිතව විෂයයන් හයකින් (6) සමත්ව සිටීම හා පිළිගත් ආයතනයකින් ලේකම්කරන පාඨමාලාවක් හදාරා තිබීම, නැතහොත්, වරලත් ලේකම් තත්ත්වය දක්වා යොමුවන විභාගයන් සඳහා හදාරමින් සිටීම සමග අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද **හෝ**
- අදාළ සුදුසුකම් සහිතව වරලත් ලේකම්වරයෙකු ලෙස වසර 02ක පළපුරුද්ද.

**වැටුප :** 2019.09.15 දිනැති අංක 01/2019 දරන, කළමනාකරණ සේවා චක්‍රලේඛයේ A වර්ගීකරණයේ PS6 තලය ප්‍රකාරව වේ. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට 8% කින් දායක විය යුතු අතර, සේවායා විසින්, ඒ සඳහා 12% මෙන්ම සේවක භාරඅරමුදලට 3% ක්ද වශයෙන් දායකත්වය ලබාදේ.

## 02. මූල්‍ය සහකාර තනතුර

**සුදුසුකම් :**

- අ.පො.ස (සා/පෙළ) විභාගය සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂා ගණිතය විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ඇතුළත්ව විෂයයන් හයකින් (6) එක් වාරයකදී සමත්ව සිටීම සහ අ.පො.ස (උ/පෙළ) විභාගය සියලුම විෂයන්ගෙන් (පොදු ප්‍රශ්ණ පත්‍රය හැර) එක් වරකදී සමත්ව සිටීම (පැරණි විෂය නිර්දේශය යටතේ, එක් වරකදී විෂයයන් 3ක් සමත්ව සිටීම ප්‍රමාණවත් වේ).

**වැටුප :** අංක 03/2016 දරන, සේවා ක්ෂේත්‍රය MN-2 ශ්‍රේණිය III, රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය ප්‍රකාරව වේ. සේවකයා විසින් සේවක අර්ථසාධක අරමුදලට 8% දායකත්වයක් ලබාදිය යුතු අතර, සේවායා විසින්, ඒ සඳහා, 12% මෙන්ම සේවක භාර අරමුදලට 3% ක්ද වශයෙන් දායකත්වය ලබා දේ.

**පොදු කොන්දේසි :**

(i) අයදුම්කරුගේ වයස, 2023.06.09 දිනට අවුරුදු 64 අඩු විය යුතුය.

(ii) බඳවා ගැනීම, කොන්ත්‍රාත් පදනමින් වසර එකක් සඳහා වන අතර, අවශ්‍යතාවය මත දීර්ඝ කිරීමට අවකාශ ඇත.

(iii) විදේශ අරමුදල් යෙදවූ ව්‍යාපෘතිවල සේවය කොට පළපුරුදු විශේෂයෙන් රජයේ සේවයේ, අයදුම්කරුවන්හට ප්‍රමුඛතාව හිමිවේ.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, තම ජීවදත්ත සහිත අයදුම්පත්, ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ ඇමතුම් විස්තර සහිතව, ඊ මේල් hiqipmoh@gmail.com වෙත හෝ ලියාපදිංචි තැපෑලෙන් එවිමෙන් පහත සඳහන් ලිපිනය වෙත, 2023 ජුනි 09 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**ව්‍යාපෘති අධ්‍යක්ෂ,**
**සෞඛ්‍ය තොරතුරු හා තත්ත්ව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය,**
**සෞඛ්‍ය අමාත්‍යාංශය, 1 වන මහල, මහජන සෞඛ්‍ය සංකීර්ණය,**
**අංක 555/5, ඇල්විටිගල මාවත, කොළඹ 05.**